# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1856/7 - 2014 මාර්තු මස 31 වැනි සඳුදා - 2014.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/KUN/04/07/16/04/41.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/15/ 2012/ වීඊ/188.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළයේ සුළු කොට්ඨාසයේ ගෝනවල යන ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2014.02.19 දිනැතිව මැන සකස් කරන ලද අංක මහ 6332 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන කිංග්ස්ටන්වත්ත නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0488ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස

01. **කැබලි අංක 1 - ඉඩමේ නම: කිංග්ස්ටන්වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0488**

මායිම්:
උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), ඒ. ජී. සුමනදාස හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත සහ ගාමිණී සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත; නැගෙනහිරට: ගාමිණී සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත සහ සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත; දකුණට: සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා): බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඒ. ජී. සුමනදාස හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත.

හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: 01. එන්. ඩී. එස්. වීරක්කොඩි, අංක 249/සී, මහා විහාර පාර, මොල්ලිගොඩ, වාද්දුව

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2014 මැයි මස 19 වැනි දින පෙ. ව. 10.00 ට කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2014 මැයි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

එල්. ඒ. ඩී. ගීතා ඉන්ද්‍රානී,
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

2014 මාර්තු මස 19 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-443

---

ශුද්ධි පත්‍රයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: ආණ/ඉ/2/5/1.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 03/J/83/IR/241.

2011.09.09 දිනැති 1722/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 4 ඒ පිටුවෙහි පළකරන ලද ඉඩම්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අත්පත් කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ පළ වී ඇති අනු අංක 12 යටතේ සඳහන් කර ඇති කැබලි අංක 64 හි සඳහන් ඔයගෙදර කුඹුර-ප්‍රමාණය හෙක්ටයාර් 1.326 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
ආණමඩුව.

2014 මාර්තු මස 25 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.